# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2298/54 - 2022 සැප්තැම්බර් මස 23 වැනි සිකුරාදා - 2022.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනත**

ඓතිහාසික සංඛපාල රජමහා විහාරයේ ඇසළ පෙරහැර මංගල්‍යය - 2022

ඉහත සඳහන් උත්සවය 2022 සැප්තැම්බර් මස 26 වැනි දිනෙන් ආරම්භ වී 2022 ඔක්තෝබර් මස 13 වැනි දින නිමාවට පත්වන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

වන්දනා ගමන් ආඥාපනතේ විධිවිධාන අනුව ඇති රෙගුලාසි උත්සව කාලය තුළ වලංගුව පවතින බව මහජනයාගේ අවධානයට ලක් කරමි.

2019 දෙසැම්බර් මස 12 දාතම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හා අංක 2153/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් වේ.

**මාලනී ලොකුපෝතාගම,**
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය,
කඳවුරු භාර නිලධාරී.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

1A - G 37571 — 08 (2022/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඓතිහාසික සංඛපාල රජමහා විහාරයේ ඇසළ පෙරහැර මංගල්‍යය - 2022**

2019 දෙසැම්බර් මස 12 දාතම හා අංක 2153/15 දරන *ගැසට් පත්‍රය*, 2020 සැප්තැම්බර් මස 16 දාතම හා අංක 2193/2 දරන *ගැසට් පත්‍රය*, 2021 ඔක්තෝබර් මස 01 දාතම හා අංක 2153/15 දරන *ගැසට් පත්‍රය* යන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රවල* පළ වූ වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහ ජනතාවගේ අවධානය යොමු කරවමි. එම රෙගුලාසි හා සම්බන්ධ පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

**01. පෙරහැර පවත්වන කාල සීමාව -**

- මෙවර ඓතිහාසික සංඛපාල රජමහා විහාරයේ ඇසළ පෙරහැර මංගල්‍යය 2022 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දිනෙන් ආරම්භ වී ඔක්තෝබර් මස 13 වැනි දින අවසන් වන බව දැනුම් දෙමි.

| | |
|---|---|
| * කප් සිටුවීමේ මංගල්‍යය | 2022.09.26 |
| * තිස් පැයේ පිරිත් දේශනය | 2022.10.05 |
| * සාංඝික දානමය පිංකම සහ රාත්‍රී චෛත්‍ය වන්දනාව | 2022.10.06 |
| * කුඹල් පෙරහැර මංගල්‍යය | 2022.10.07 |
| * සළු පෙරහැර මංගල්‍යය | 2022.10.08 |
| * රන්දෝලි පෙරහැර මංගල්‍යය | 2022.10.09 |
| * ගිනිසිළු පෙරහැර සහ ගිනි පෑගීමේ මංගල්‍යය | 2022.10.10 |
| * මහා පෙරහැර මංගල්‍යය | 2022.10.11 |
| * දිය කැපීමේ හා ගම්මඩු ශාන්ති කර්මය | 2022.10.12 |
| * අලුයම දේව දානය පිරිනැමීමෙන් ඇසළ පෙරහැර මංගල්‍යය නිමා කිරීම | 2022.10.13 |

**02. කඳවුරු ප්‍රදේශ යනු -**

උතුරට : සංඛපාල කන්ද ද, දකුණට : රක්වාන ගඟ ද, නැගෙනහිරට : පෙරහැර මාවත ද, බස්නාහිරට : පෙරහැර මාවත ද යන සීමාවන්ට මැදිව පිහිටි භූමි භාගය ඇසළ උත්සවය පවත්වන භූමි භාගය වේ.

**03. වාහන -**

3.1. මාගේ හෝ බලයලත් නිලධාරියෙකුගෙන් හෝ ලබාගත් අවසරයකින් තොරව, කිසිවෙකු විසින් මෝටර් වාහනයක්, බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන වෙන් කර ඇති රථ ගාල් පරිශ්‍රයේ හැර, වෙනත් කිසිදු ස්ථානයක හෝ උත්සව භූමිය තුළ නතර කර තැබීම හෝ ඇතුල් කිරීම නොකළ යුතු ය.

3.2 රත්නපුර, ඇඹිලිපිටිය ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදිකර ඇති ප්‍රධාන වාහල්කඩ තුළින් විහාර භූමියට වාහන ඇතුළු කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

**04. ගොඩනැගිලි ඉදිකිරීම -**

4.1 මාගෙන් හෝ බලයලත් නිලධාරියෙකුගේ හෝ ලිඛිත අවසරයක් නොමැතිව, 2022 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින සිට ඔක්තෝබර් මස 13 වැනි දින දක්වා වන කාලය තුළ කඳවුරු ප්‍රදේශය තුළ යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ තැනීමක් හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් කොටසක් එකතු කිරීම නොකළ යුතුය.

4.2 එසේ වුව ද, මාගේ හෝ බලයලත් නිලධාරියෙකුගේ හෝ නියෝග අතුරින්, යම් නියෝගයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුලු වීම සහ යම් දැන්වීමක් හෝ නාමපුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක, යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක්, ගොඩනැගීමක් සිදු කිරීමට අවසර ලැබෙනු ඇත.

05. **සෞඛ්‍යය** -

5.1 යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළු නොවිය යුතු අතර, රට තුළ පවතින වර්තමාන සෞඛ්‍ය උපදෙස්වලට අනුකූලව ක්‍රියා කිරීමට තරයේ වග බලා ගත යුතුය.

5.2 පෙරහැර මංගල්‍යයට පෙර හා පෙරහැර මංගල්‍යය පැවැත්වෙන කාලය තුළ සෞඛ්‍ය සේවා සැපයීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය උඩවලව, දිස්ත්‍රික් මහ රෝහල ඇඹිලිපිටිය, මූලික රෝහල උඩවලව සහ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට පවරමි.

06. **වෙළඳාම** -

6.1 මාගේ හෝ බලයලත් නිලධාරීන්ගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් උත්සව භූමිය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යක් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතු අතර පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට පූජාභූමි සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා සියලුම මත් ද්‍රව්‍ය විකිණීම හා භාවිත කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

6.2 කඳවුරු භූමිය තුළ දැනට පවත්නා මල්, පූජා භාණ්ඩ අලෙවි කරන වෙළෙඳ සැල් සහ ප්‍රධාන පාර දෙපස ඇති වෙළඳ සැල් පෙරහැර පැවැත්වෙන කාල සීමාව තුළ රටෙහි පවතින සෞඛ්‍ය උපදෙස්වලට අනුකූලව ක්‍රියාත්මක කිරීමට තරයේ වගබලාගත යුතු ය.

6.3 කඳවුරු භූමියට පිවිසුම් මාර්ගය දෙපසේ දැනට ඉදිකර ඇති මල්, පූජා භාණ්ඩ අලෙවි සැල්වල මල් පූජා භාණ්ඩ අලෙවි කිරීම හැර කිසිවෙකු විසින් පූජා භූමිය තුළ කඩයක් තැනීම පවත්වාගෙන යාම, කිසිවක් වෙළෙඳාම් කිරීම නොකළ යුතු ය.

6.4 සෑම ගොඩනැගිල්ලකම හා සෑම වෙළඳසැලකම කසල බඳුනක් තිබිය යුතු අතර ස්ථානයේ අපද්‍රව්‍ය එහි බහාලිය යුතු ය.

6.5 විකිණීමට තබා ඇති සකස් කළ සියළු ආහාර ද්‍රව්‍ය මැස්සන්ගෙන් ආරක්ෂා වන පරිදි ආරක්ෂා වන පරිදි ආවරණයක් සහිත පෙට්ටිවල රඳවා තැබිය යුතු ය.

07. **යාචකයෝ** -

* හිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා පූජා භූමියෙන් පිටත වෙන් කර ඇති හෝ සපයනු ලැබ ඇති ස්ථානයන්හි දී මිස, කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට යමක් දීම හෝ පිනට යමක් බෙදා හැරීමට හෝ අවසර නොමැත.

08. **විදුලිය පහසුකම්** -

* විහාර භූමිය හා පෙරහැර ගමන් මග වීදි ලාම්පු හා අමතර ලාම්පු සවිකිරීම ලංකා විදුලිබල මණ්ඩලයට හා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට පවරමි.

09. **ජලය** -

* බැතිමතුන්ට අවශ්‍ය පානීය ජලය 'අමතර ජල ටැංකි යෙදීම බවුසර' සඳහා ජලය සපයමින් පහසුකම් සැපයීම' ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය උඩවලව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව හා ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරමි.

10. **ආරක්ෂාව** -

* සියලු ආරක්ෂක කටයුතු පෙරහැර හා බැතිමතුන්ට අවහිර නොවන ලෙස මාර්ගයේ රථවාහන හැසිරවීම ආරක්ෂක අංශ හා පොලීසිය වෙත පවරමි.

11. **නවාතැන් පහසුකම්** -

* පෙරහැර සඳහා සහභාගි වන නැටුම් කණ්ඩායම් සඳහා කොළඹගෙආර මහා විද්‍යාලය, සංඛපාල ගුණරතන විද්‍යාලය යොදා ගතයුතු අතර, සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව කටයුතු සිදුකළ යුතු ය. එම කටයුතු සිදුකිරීම ඇඹිලිපිටිය කලාප අධ්‍යාපන කාර්යාලය හා අදාළ විද්‍යාලයන්හි විදුහල්පතිවරු වෙත පවරමි.

ඉහත අංක 03 සිට 11 දක්වා නියෝග පෙරහැර මංගල්‍යය අවසන් වනතුරු වලංගු වේ.

EOG 09 - 0247

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.